# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
## DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යාංශය.
මහලේකම් කාර්යාලය, කොළඹ 01

நிதி அமைச்சு
செயலகம், கொழும்பு 01

MINISTRY OF FINANCE
The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No: DMA/Sys.Aud/check list/01
ඔබේ අංකය / உமது இல / Yur No:
දිනය / திகதி / Date: 2019.07.15

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්

අභ්‍යන්තර විගණකවරුන්

**<u>ගෙවීම් වවුචර් සංනිරීක්ෂණය කිරීම</u>**

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් / අභ්‍යන්තර විගණකවරුන් විසින් අභ්‍යන්තර විගණනයේදී අනුගමනය කරන විගණන ක්‍රියාපටිපාටියක් වන ගෙවීම් වවුචර් සංනිරීක්ෂණය කිරීමේදී අදාල කරගත හැකි පිරික්සුම් ලැයිස්තුව ඇමුණුම අංක 01 ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

02 ඇමුණුම් ගත පිරික්සුම් ලැයිස්තුවට අතිරේකව පවතින විශේෂ කරුණු වෙතොත් එවැනි පරීක්ෂා කිරීම්ද කලයුතු වේ.

03 තම විගණන සහායකයින් වෙතින් ගෙවීම් වවුචර් පරීක්ෂා කරවීමේ විගණන ක්‍රියාකාරකම් වලදී මෙම පිරික්සුම් ලැයිස්තුව අනුව අදාල පරීක්ෂාවන් සිදුකර එය තම ජංගම විගණන ලිපිගොනුවේ විගණන සාක්ෂි ලෙස ගොනුගත කල යුතු අතර විෂමතාවයන් වෙතොත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද ඇතුලත් නිර්දේශ සමගින් තම ආයතන ප්‍රධානියා වෙත විගණන වාර්තාව මගින් වාර්තා කිරීම කලයුතු වේ.

එස්. ජී. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්


කාර්යාලය / அலுவலகம் / Office 2484816 2484500 2484600 2484700

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General (9411) 2484543

ෆැක්ස් / பெக்ஸ் / Fax 2449496

වෙබ් අඩවිය / வெப் சைட் / website www.treasury.gov.lk

# වවුචර් සංනිරීක්ෂණ ලැයිස්තුව

ආයතනයේ නම: ...................................................... විගණන වර්ෂය: [ ]

පරීක්ෂා කළ දිනය :.................................................. විගණන මාසය: [ ]

විගණන නිලධාරියාගේ නම: ..................................

| අනුක්‍රමික අංකය | විස්තරය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | අනුක්‍රමික අංක අනුව ගෙවීම් වවුචර් අංක කර තිබේද? මු.රෙ. 261(1) | | | | | | | | | | |
| 2 | මු.රෙ. 234 අනුව වවුචරය සකස් කර තිබේද? | | | | | | | | | | |
| 3 | වියදම අනුව වැය විෂය විස්තර නිවැරදි ද? | | | | | | | | | | |
| 4 | වවුචරයේ වටිනාකම නිවැරදිව වැය ලෙජරයේ සටහන් කර තිබේද? | | | | | | | | | | |
| 5 | වියදම සඳහා නිසිබලධරයා විසින් බලය දී තිබේද? (මු.රෙ. 136) | | | | | | | | | | |
| 6 | නිසිබලධරයා විසින් ගෙවීම් අනුමත කර තිබේද? (මු.රෙ. 137) | | | | | | | | | | |
| 7 | ඉකුත් ගෙවීම් සඳහා මු. රෙ 115 (3) අනුමැතිය වවුචරයට අමුණා තිබේද? | | | | | | | | | | |
| 8 | නිසිබලධරයා විසින් වියදම සහතික කර තිබේද? (මු.රෙ. 138) | | | | | | | | | | |
| 9 | බලය ලත් නිලධාරින් විසින් ගෙවීම නිසිපරිදි සිදුකර තිබේද? (මු.රෙ. 139) | | | | | | | | | | |
| 10 | මු.රෙ. 141 (2) අනුව ගෙවීම සඳහා වූ අත්සන් නිවැරදිව තබා තිබේද? | | | | | | | | | | |
| 11 | වවුචරයේ සකස් කල බවට අත්සන් කර තිබේද? (මු.රෙ. 225 (4)) | | | | | | | | | | |
| 12 | වවුචරයේ පරීක්ෂා කල බවට අත්සන් කර තිබේද? (මු.රෙ. 225(4)) | | | | | | | | | | |
| 13 | ගෙවීම් ගොනුවේ අංකය නිවැරදිව වවුචරයේ සටහන් කර තිබේද? | | | | | | | | | | |
| 14 | වියදම තහවුරු කිරීමේ ලියවිලි වවුචරයට අමුණා තිබේද? | | | | | | | | | | |
| 15 | කොන්ත්‍රාත් ගෙවීමක් නම්, | | | | | | | | | | |
| | 1. බිල්පත | | | | | | | | | | |
| | 2. ප්‍රමාණපත්‍රය | | | | | | | | | | |
| | 3. මු.රෙ.237 අනුව කාර්මික නිලධාරි / ඉංජිනේරු සහතිකය | | | | | | | | | | |
| | 4.විචලන වාර්තාව (අවශ්‍ය අවස්ථා වලදී) | | | | | | | | | | |
| 16 | සැපයුම් හෝ සේවා ගෙවීම් නම්, | | | | | | | | | | |
| | 1. මිලදී ගැනීමේ ඇණවුම, | | | | | | | | | | |
| | 2. ඉන්වොයිසියේ මුල්පිටපත, | | | | | | | | | | |
| | 3. බඩු ලැබීමේ නිවේදනය (GRN) / භාණ්ඩ ගබඩාවට ලැබීමේ සහතිකය (මු.රෙ. 715) | | | | | | | | | | |
| | 4. අනුකූලතා සහතිකය Compliance Certification | | | | | | | | | | |
| | 5. ප්‍රසම්පාදන තිරණ ආදිය | | | | | | | | | | |
| 17 | මුදල් පොතේ නිසි පරිදි ගෙවීම සටහන් කර තිබේද? | | | | | | | | | | |
| 18 | ගෙවීම් ලබන්නා නිවැරදිද? | | | | | | | | | | |
| 19 | වවුචරය මගින් ගෙවන මුදල නිවැරදි ද? | | | | | | | | | | |
| 20 | මුදල ඉලක්කමෙන් සහ අකුරෙන් නිවැරදිද? | | | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 21 | ගෙවීම් ලබන්නා මුදල් ලබාගත් බවට වවුචරයේ අත්සන් කර තිබේද? (මු.රෙ. 264 (1)) | | | | | | | | | | |
| 22 | ගෙවීම අලුත්වැඩියාවන් සඳහා නම් අලුත්වැඩියාව නිවැරදිව කර ඇතිබව අදාල වගකිවයුතු නිලධාරියෙකු සහතික කර තිබේද? | | | | | | | | | | |
| 23 | 1. වාහන අමතර කොටස් සවිකිරීම් සඳහා වූ ගෙවීමක් නම් ඉවත්කල අමතර කොටස් නිසිපරිදි භාරදී තිබේද? | | | | | | | | | | |
| | 2. අලුත් වැඩියාව නිසි පරිදි සිදුකර ඇති බවට මෝටර් රථ පරීක්ෂක හෝ බලයලත් නිලධාරියෙකු සහතික කර තිබේද? | | | | | | | | | | |
| 24 | තාක්ෂණ උපකරණ මිලදී ගැනීමක් සඳහා වූ ගෙවීමක් නම් තාක්ෂණ දැනුම ඇති නිලධාරියෙකු හෝ තාක්ෂණ ඇගයීම් කමිටුවක් විසින් අදාල පිරිවිතර අනුව භාණ්ඩ ලද බව සහතික කර තිබේද? | | | | | | | | | | |
| 25 | 1. සෑම වවුචරයකට "ගෙව්වා" මුද්‍රාව යොදා තිබේද? | | | | | | | | | | |
| | 2. ගෙව්වා මුද්‍රාව තුල චෙක්පත් අංකය හා දිනය සටහන් කර ගෙවන නිලධාරියා විසින් කෙටි අත්සන තබා තිබේද? | | | | | | | | | | |
| | 3. ඇමුණුම් ගත තහවුරු කිරීමේ ලියවිලි වලද "ගෙව්වා" මුද්‍රාව තබා චෙක් අංකය, දිනය හා කෙටි අත්සන ගෙවන නිලධාරියා විසින් තබා තිබේද? මු.රෙ. 261 (2), 262 (2) (3) | | | | | | | | | | |
| 26 | VAT මුදල නිවැරදි ද? | | | | | | | | | | |
| 27 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වැට් ලියාපදිංචි සහතිකය අමුණා තිබේද? | | | | | | | | | | |
| 28 | වැට් ලියාපදිංචි සහතිකයේ වලංගුතාවය ගණකාධිකාරි විසින් තහවුරු කරගෙන තිබේද? | | | | | | | | | | |
| 29 | කොන්ත්‍රාත් ගෙවීමක් නම් රැඳවුම් මුදල නිවැරදි ද? | | | | | | | | | | |
| 30 | අත්තිකාරම් ගෙවා ඇත්නම් එය අයකර ගෙන තිබේද? | | | | | | | | | | |
| 31 | වවුචරයෙන් කල යුතු සියලු අඩුකිරීම් නිවැරදිව අඩුකර තිබේද? | | | | | | | | | | |
| 32 | ශුද්ධ ශේෂය නිවැරදි ද? | | | | | | | | | | |
| 33 | චෙක්පත් මගින් කල ගෙවීමක් නම් මු.රෙ. 385, 386, 387, 388, 389, 391, 392, 394 නීති වලට අනුගතද? | | | | | | | | | | |

.............................
අත්සන

15 . 07 . 2019
.............................
දිනය